GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

06-07-2012

**මාධ්‍ය නිවේදනයි**

වෛද්‍යවරුන් දිප ව්‍යාප්ත සේවයට අයත් බව 1999-12-15 දින අති ගරු ජනාධිපතිතුමිය නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රයක් මගින් තහවුරු කර ඇත. මේ අනුව සියලුම වෛද්‍යවරුන්ගේ පත් විම් මධ්‍යම රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අයත් රාජකාරියකි. එබැවින් මධ්‍යම රාජ්‍ය සේවා කොමිෂන් සභාව හරහා සෞඛ්‍ය ලේකම්වරයා විසින් සිදු කරන ලද සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක පත්වීම් වහාම ක්‍රියාත්මක කලයුතුබව අප අවධාරණය කරමු

මීට සති 3කට පමණ පෙර මේ පිළිබඳව සෞඛ්‍ය ලේකම්වරයා දැනුවත් කර අදාල පියවර ගැනිමට කටයුතු කලද මෙතෙක් මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තනතුර පිලිබඳ ගැටළුව නිරාකරණය වී නොමැත. දැනට වෛද්‍යවරියන් දෙදෙනෙකු තමන් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ලෙස කටයුතු කරන බව වෛද්‍යවරුන්ව දැනුවත් කිරීම නිසා මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවය බරලතල ව්‍යාකුල තත්ත්වයකට පත්ව ඇත. පරිපාලන ව්‍යකුලත්වය නිසා එහි කටයුතු කරන වෛද්‍යවරුන් දැඩි අපහසුතාවයන්ට මුහුණ පා ඇත.

මෙම ව්‍යකුල තත්ත්වය ඉදිරි දින කිහිපය තුල නිරාකරණය නොවුවොත් මධයම පළාතේ සෞඛ්‍ය සේවාව අකර්මණ්‍යවීමේ බරපතල අවධානමක් ඇති බව දන්වා සිටිමු.

පළාත් ආණ්ඩුකාරවරුන් මධ්‍යම රාජ්‍යසේවා කොමිෂන් සභාවේ තිරණ ක්‍රියාත්මක කරමින් වගකීමෙන් යුතුව කටයුතු කරනු ඇතැයි අප උදක්ම අපේකෂා කරමු.

ස්තුතියි

වෛද්‍ය නලින් ආරියරත්න
සහකාර ලේකම්

වැඩිදුර විස්තර - වෛද්‍ය නවීන් ද සොයිසා -0718582444